උදව්වට.එහෙම වලව්වට ආපු මංගලී එක්ක ගැටඹෙ ගෙදර බාප්පා සම්බන්ධයක් ඇතිකරගෙන. මංගලී හරිම ලස්සනයි. හරියට නූතාන් වගේ කියලා කට්ටිය කථාවෙනවා මට ඇහිලා තියෙනවා. දරු ප්‍රසූතියෙන් පස්සෙ ඇති වෙච්ච හුදෙකලා මානසිකත්වය ත් එක්ක බාප්පගෙ වෙනස්වීම පුංචිව විශාල මානසික අවපීඩනයකට ලක්කරන්න ඇති. දිවි නසාගන්න තත්ත්වෙට ඒ අවපීඩනය දරුණු වෙන්න ඇති. අවසානෙදි වුණේ පුංචි ආර්තීට තමන්ගෙ අම්මා නැතිවෙච්ච එක. කවුරු හරිද කවුරු වැරදිද කියලා බලනවට වඩා අපේ අම්මා කළේ ඒ දරුවට අම්මෙක් වෙන්න උත්සාහ කරපු එක.

ගැටඹෙ ගෙදර බාප්පවත් , අත්තම්මවත් ඉන්නකං ආර්තීව අපේ අම්මා ලඟට ගන්න අමාරු වුණා.ඒත් සතිඅන්තෙයි ඉස්කෝලෙ නිවාඩු කාලෙයි ආර්ති වැඩිපුර හිටියෙ අපේ ගෙදර.මට ආර්තිව දැනුනෙ මගේම නංගි හැටියට. අපේ අයියත් ආර්තිට පුදුම විදියට ආදරේ කළා.අපේ අයියා අපිට වැඩිය අවුරුදු දොළහකට වැඩිමල්.ඉතින් අයියයි අපියි අතරේ තිබුණෙ විශාල පරතරයක්. මං මෙච්චර වෙලා ආර්තී ගැන විස්තර කළේ ආර්තී සහ මං අතර තියෙන නෑකමට එහා ගිය මිත්‍රත්වයත් අවබෝධයත් පැහැදිලි කරන්න.

අපේ අම්මලා තාමත් පුංචි වෙනුවෙන් දානමාන දීලා පිංකං කරනවා.අන්තිමට දීපු දානෙ වෙලාවෙදි මට ආර්තිලව හම්බුණාම තමා දුලිනි ගැන මට කිව්වෙ. ආර්තී විවාහ වුණේ මගේ හොඳම මිත්‍රය නිල්හාන් එක්ක. ආර්තිගෙ විවාහ උත්සවේ දවසෙ අපේ අප්පච්චි නිල්හාන්ගෙ අත් දෙක අල්ලගෙන අඬලා කිව්වා "අනේ පුතේ මගෙ කෙල්ලට කිසිම දුකක් දෙන්න එපා" කියලා. අප්පච්චි ආර්ති වෙනුවෙන් කප්පරක් ආදරයක් හිතේ ගුලි කරං ඉඳලා කියලා අපි දැනගත්තෙ එදා. ගැටඹෙ බාප්පා ඒ වෙද්දි අපි අතරින් සමුඅරන් හිටියෙ. අපේ අම්මලාත් මාමලාත් ආර්තී වෙනුවෙන් ලෝබ නැතුව ඉඩ කඩං ලිව්වා. අපේ පුංචිගෙ දෑවැද්දට දීපු දේපලත් මාමලා ගැටඹෙ බාප්පට බලකරලා ඒ කාලෙම ආර්තිට ලියවලා දීලා තිබුණා. අද ආර්තී ලොකු දූලා දෙන්නෙක්ගෙ ආදරණීය අම්මා කෙනෙක්. මගේ මිත්‍රය නිල්හාන් ආර්තීව ආදරෙන් බලා ගන්නවා.ආර්තීගෙ ලොකු දුව අපේ පුංචි වගේමලු. නිල්හාන් කෙල්ලට නම දාන්න මට බාර කළා. මට දුවට නම දැම්මෙ " දිලෙනා" කියලා. දුලිනිව බැඳලා දුවෙක් ලැබුණොත් ඒ නම දාන්නයි මං හිතං හිටියෙ. ඒත් ඒ වෙද්දි දුලිනි සසංකගෙන් නීතියෙන් වෙන්වෙලා පිටරටක පදිංචියට ගිහිං හිටියා ගිහිං හිටියා.

**මතු සම්බන්ධයි**

VCE Chemistry 2015
Individual and Groups
Early completion of syllabus and Exam preparation
Home Visited
Priyantha Liyanage
0407664546

**Tutoring**

**22 years** of experience in tutoring in Melbourne with **Proven Results.......!**

***Coaching for***
- Mathematics for Primary and Secondary
- VCE Mathematics: *Mathematical Methods, General Mathematics, Further Mathematics, Specialist Mathematics*
- VCE Physics
- English from Primary to year 9
- Science for Secondary

- Scholarship and Selective School exams
*Melbourne High, Mac.Robertson, Suzanne Cory, Uni High, John Monash, Ivanhoe Grammar, Trinity Grammar, Melbourne Grammar, PEGS, etc.*

**Small groups - up to 4 students.....!**
**Individual classes on request**

**Neranjana Kudaligama**
**0408 356 821**
Masters in Accounting (La Trobe)
B. Applied Science (Computer Science and Software Engineering) (Swinburne)
Civil Eng. (Moratuwa)
Ex. Teacher, VSL - Roxburgh Park Sinhala School

**Hemantha Devendra**
**0409 854 597**
VIT Registered Teacher
Post Grad. Dip Edu.(La Trobe)
B. Design (Industrial Design) (RMIT)
Mech Eng (Moratuwa)

**විවියන් ප්‍රනාන්දු**
පානදුර

ශ්‍රී ලංකා ජාතික කොඩිය හා ජාතික ගීය කෙරෙහි පසුගිය දින කිහිපය තුළ ජනමාධ්‍යයේ විශේෂ අවධානය යොමු විය. පළමුව ජාතික ගීය කුමන හෝ ලාංකා ජාතික භාෂාවකින් ගායනා කිරීමේ අවස්ථාව සැළසිනි. මෙයට පක්ෂ කථිකා ඇතිවිය. ඉන්පසු එක්තරා වීරෝධතා ව්‍යාපාරයකට සහභාගි වූ තවත් පිරිසක් විකෘති කරන ලද ජාතික කොඩි අල්ලස් හෝ දූෂණ විමර්ශන කොමිෂන් සභා කාර්යාලය ඉදිරිපිට ඔසවා ගෙන සිටි බව පළවිය.

ජාතික කොඩියේ කහ සහ කොළ පැහැති වර්ණවලින් සමන්විත කුඩා කොටු දෙක ප්‍රධාන සුළු ජාතීන් නියෝජනය කිරීම සඳහා වෙන් කර ඇත. ඉහත සඳහන් කරන ලද විරෝධතා ව්‍යාපාරයට සහභාගි වූ පිරිසගෙන් යම් කොටසක් යටකී ලෙස විකෘති කරන ජාතික කොඩි අතැතිව සිටි බව වාර්ථාවිය. මේ සම්බන්ධව අදාල අංශ අවධියෙන් සිටිනා බවද පළවිය.

ජාතික කොඩියට නිසි ගෞරවය නොලැබෙන




තවත් අවස්ථාවක් නැත්තේද නොවේ. ජාතික කොඩිය ඔසවා තැබිය යුතු සමහර ජාතික අවස්ථාවන්හිදී එසේ එසවුනු කොඩි ආපසු සුරක්ෂිත ලෙස ගලවා තැබීම නොකෙරෙන අවස්ථා දක්නට ලැබේ. මෙහි ප්‍රතිපලයක් වශයෙන් එම කොඩි වැස්සට අව්වට ලක්ව දින, සති, මාස ගණන් එල්ලා තිබූ තැන්වලම තිබී අවලක්ෂණව, ඉරී කෑලි ගැලවී යන අවස්ථාද එමටය. මෙයින් පැහැදිලි වන්නේ අපේ ජාතික කොඩිය කෙරෙහි තිබිය යුතු නිසි ගෞරවය ලැබෙනවාද යන්නයි.

ජාතික කොඩිය සුලභව ප්‍රදර්ශනය වෙන තවත් අවස්ථාවක් හැටියට දකින්නට හැකි වන්නේ ශ්‍රී ලංකාව තවත් රටක් සමග ක්‍රිකට් තරඟයක් පැවැත්වෙන විටය. විශේෂයෙන්ම ක්‍රිකට් ක්‍රීඩා තරඟ නැරඹීමට අප ජනතාව උත්සුක වන්නට පටන්ගන්නේ 1996 ලෝක ක්‍රිකට් කුසලානය ශ්‍රී ලංකාව ජයගත් අවස්ථාවත් සමඟයි. ක්‍රිකට් තරඟ නැරඹීමට තරඟ බිමට යාමත් රූපවාහිනියෙන් තරඟ නැරඹීමත් ඉතා ජනප්‍රිය බවට බවට පත්විය. නමුත්, මෙහි තවත් පැතිකඩක් ඇත. තරඟ නැරඹීමට පිටියට පිවිසෙන බොහෝ දෙනා අප ජාතික කොඩි රැගෙන යනු දැකිය හැක. මේ අතර, මෙම නරඹන්නන්ගෙන් සමහර දෙනා ජාතික කොඩි ලෙලවා ප්‍රීති ඝෝෂා කරන අවස්ථා පෙනේ. නමුත් කණගාටුවෙන් වුවද කිව යුතුවන්නේ සමහර කොටස් තමන් රැගෙන ගිය කොඩි බිම එළා ඒ මත වාඩි වේ. තවත් සමහරක් කොඩිය සරමක් ලෙස ඇඳගෙන සිටින අවස්ථාද වේ. තවත් සමහරු තම ඇඟ වටේ ඔතාගෙන නටනා ආකාරයත්, සමහරක් අව්වෙන් බේරීමට හිස් වැසුම් ලෙසද යොදා සිටිනු දැකිය හැක. ඉතින් අපේ ජාතික කොඩිය මෙලෙස දුක් විඳින්නේ නම් ජාතික කොඩියට ලැබිය යුතු නිසි ගෞරවය ලැබෙන්නේ කෙසේද ?

මේ ගැන සිතන විට, මින් වසර තිහකට පමණ පෙර සිදුවුණු, මගේ මතකයේ රැඳුනු එක්තරා සිද්ධියක් යලි යලිත් මගේ සිහියට නැගේ. 1980 දශකයේ මුල භාගයේ ශ්‍රී ලංකා විදේශ කටයුතු අමාත්‍යංශයේ මෙහෙයවීමෙන් ජාත්‍යන්තර රැස්වීමක් කොළඹ බණ්ඩාරණායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේදී :ඊඑෂක්‍ස* පැවැත්විනි. රැස්වීම ආරම්භක උළෙල පැවැත්වීමට ස්වල්ප වේලාවකට පෙර මේ රැස්වීමට සහභාගිවීම පිණිස විදේශීය රටක් නියෝජනය කරනු පිණිස පැමිණ එක්තර නියෝජිතයෙක් තම රටේ ජාතික කොඩිය රැස්වීම් ශාලාවට ඇතුළුවන ස්ථානයේ උඩ යටිකුරු ලෙස වැරදි අන්දමින් ඔසවා තිබූ දැකීමෙන් අතිශය කණගාටුවෙන් හා තරහයෙන් රැස්වීමට සහභාගී නොවී තමන්ට වෙන්කර තිබූ හෝටලයට ගියේය. ඔහු දැඩි ලෙස පවසා සිටියේ තම රටේ ජාතික කොඩිය වහාම තමන්ට ආපසු ලබා දිය යුතු බවත් නොඑසේනම් තමා රැස්වීම වර්ජනය කරනා බවත්ය.

මෙම රැස්වීම සම්බන්ධ අපේ ප්‍රධාන සංවිධායක අධ්‍යක්ෂ තුමා මා කැඳවා යටකී විදෙස් නියෝජිතයා වෙත ප්‍රශ්නයට තුඩු දුන් ඔහුගේ රටේ කොඩිය වහාම ගෙන ගොස් භාරදෙන ලෙසත්, ඔහු වෙත ඉතා කාරුණිකව අපගෙන් සිදුවූ ප්‍රමාද දෝෂය පිළිගෙන සමාව අයද සිටින ලෙසත්, මාධ්‍ය වෙත මෙම තොරතුරු යාමට පෙරාතුව කඩිනමින් මෙය සිදු කරනා ලෙස උපදෙස් දුනි. ඒ අනුව ඔහු නැවතී සිටි හෝටලය වෙත ගොස් එම් නියෝජිතවරයාට කොඩිය භාරදුනි. සතුටට පත් ඔහු මහත්මා විලාසයෙන් මගේ කරුණු පැහැදිලි කිරීම ඉතා නිහතමානීව බාරගත් නමුත්, මෙම සිද්ධියේ අති විශේෂත්වය වූයේ තමාගේ රටේ ජාතික කොඩිය ආපසු තම අතට පත් වීමෙන් පසුව ඔහුගේ ප්‍රතිචාරයයි. ඒ විදේශ නියෝජිතවරයා මහත්වූ උද්දාමයෙන් තම දෑතම දිගුකර මගෙන් කොඩිය ලබාගෙන හෝටල් කාමරයේ මේසය මත එය දිගහැර දණින් වැටී කොඩියට වන්දනා කරන ලීලාවෙන් මහත්වූ හරසර නමස්කාර පූර්වකව කොඩිය සිප වැළඳ ගති.

නමස්කාර පූර්වක සිප වැළඳ ගැනීම කෙසේ වෙතත්, අපගේ ජාතික කොඩියට හිමි හා ලැබිය යුතු නිසි ගෞරවය වත් අප රටේ කී-දෙනෙකුගෙන් ලැබෙනවාද යන ප්‍රශ්නයකි.